**අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා අරමුදලින් ඉටු කිරීමට යෝජිත කර්මාන්ත 15 ක වැඩ ආරම්භ කර නොතිබූ නමුත් ඊට අදාළ ඇස්තමේන්තු වටිනාකම වූ රු.7,500,000 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.908,496 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.251,445 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමානතාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඈ)** **ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2008 වර්ෂයේ සිට ඉදිරියට එන රු.47,466 ක් වූ ලැබිය යුතු තැන්පත් ගිණුමේ ශේෂය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අයකිරීමට කටයුතු කරමි. |

**(ඇ)** **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.155,217,382 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 174 (ii) වගන්තිය | 135,427 | සෝපාවක් මිලදී ගැනීමේදී මිල ගණන් කැඳවීමක් හෝ ලියාපදිංචි සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>-------------------<br>(i) මුදල් රෙගුලාසි 101 සිට 113 දක්වා | 18,200 | සභාවට අයත් මහජන පුස්තකාලවල පවත්වා ගෙන යනු ලබන පරිග්‍රහන ලේඛන අනුව අස්ථානගත වී තිබූ පොත් 123 ක් සම්බන්ධ යෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) මුදල් රෙගුලාසි 570,571 හා 572 | 16,815,575 | වර්ෂ 02 ක කාලය ඉක්මවන ලද තැන්පතු ශේෂ පිළිබඳ විස්තරයක් නොතිබුණ අතර, යොමුගත රෙගුලාසි ප්‍රකාරව ද කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | 750,000 | සභාවේ කැබ් රථයක් අපහරණ කිරීම සඳහා වාර්තා ලබාගෙන වසරකට අධික කාලයක් ගත වී තිබුණද, අපහරණය කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,316,879 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,607,197 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අක්කර බදු | 58,850 | 15,600 | 3,517 | 225,089 | 18,000 | 16,325 | 3,879 | 213,006 |
| කුලී | 3,555,350 | 2,502,360 | 3,003,751 | 60,306 | 2,600,000 | 2,300,060 | 1,781,705 | 561,697 |
| බලපත්‍ර ගාස්තු | 1,382,300 | 1,559,650 | 958,730 | 712,895 | 1,600,000 | 1,328,260 | 1,216,285 | 111,975 |
| | 4,996,500 | 4,077,610 | 3,965,998 | 998,290 | 4,218,000 | 3,644,645 | 3,001,869 | 886,678 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු මුළු ආදායම රු.4,964,288 ක් වුවද, රැස් කළ ආදායම රු.3,965,998 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.998,290 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේ දී අයවැය ප්‍රකාරව ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී අයවිය යුතු අක්කර බදු ආදායම රු.228,606 ක් වූ අතර, වර්ෂය තුළ අයවීම් රු.3,517 ක් වීමෙන් වර්ෂය අවසානයට රු.225,089 ක හිඟ ශේෂයක් විය. අක්කර බදු හිඟ ශේෂය වාර්ෂිකව වැඩිවෙමින් පැවති අතර හිඟ ශේෂ අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | විධිමත් වැඩපිලිවෙලක් සකස් කර, හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු ආදායම රු.1,671,625 ක් වුවද, රැස්කළ ආදායම රු.958,730 ක් හෙවත් සියයට 61 ක් වීමෙන් බලපත්‍ර ගාස්තු අයවීම සතුටුදායක මට්ටමක නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගනිමි. |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.6,826,562 ක් සහ මුද්දර ගාස්තු රු.47,114,680 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ප්‍රධාන ලේකම්ගෙන් හිඟ මුදල් ලබා ගැනීමට ලිපි යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

-----------------------------------------

| | | |
| --- | --- | --- |
| බටපොල දෙමහල් වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 14 සඳහා ප්‍රධාන තක්සේරුකරු ලබා දී තිබූ නව තක්සේරුව අනුව 2015 පෙබරවාරි 09 දින සිට මාසිකව රු.57,400 ක මුදලක් අයකර ගත යුතු වූ නමුත්, රු.7,700 ක මුදලක් පමණක් අයකිරීම නිසා මාසිකව රු.49,700 ක පාඩුවක් සිදුව තිබුණි. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර, තක්සේරු වටිනාකම අය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/53 දරන ගැසට් නිවේදනය අනුව කසළ කළමනාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා සභාව දිගුකාලීන සැලැස්මක් සකස් කර නොතිබුණි. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ද්විතියික මට්ටමේ නිලධාරින් 08 කගේ අතිරික්තයක් හා ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 08 ක පුරප්පාඩු පැවැතුණි. | අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් පුරප්පාඩු සඳහා විධිමත්ව බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) සේවක ණය**

| | | |
|---|---|---|
| 1997 වර්ෂයේ සිට පැවත එන සේවයෙන් විශ්‍රාම ගිය, විදේශගත සේවය හැර ගිය හා මිය ගිය සේවකයින් 12 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.197,600 ක් වූ, සේවක ණය ශේෂය අදාළ නිලධාරීන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතු වේ. | හිඟ ණය ශේෂ ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3.3 හානි හා පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේදී කර්මාන්ත ඉටුකිරීමට කොන්ත්‍රාත් සමාගම් වෙත ලබා දී තිබූ තාර වෙනුවෙන් ලැබිය යුතු මුදල බිල්පත් වලින් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් රු.2,791,487 ක් අයවිය යුතුව පැවතුණි. | අදාළ මුදල් කඩිනමින් අයකළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයන් 02 ක එකතුව රු.1,466,291 ක් වූ ප්‍රතිපාදන ඉතිරිවීම් වූ අතර, එය සියයට 20 සිට සියයට 26 අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |
| (ආ) | එක් ආදායම් විෂයයක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.892,390 ක් හෙවත් සියයට 25 ක් විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුය. | ඉදිරියේ දී කටයුතු කරන බව. |